කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016

විද්‍යාව

8 ශ්‍රේණිය කාලය පැය :- 02

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම :-...

1 කොටස

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ස්වභාවික භෞමික පරිසර අතර තෘණභූමි ඉතා වැදගත්ය. ශ්‍රී ලංකාවට ආවේණික සපුෂ්ප ශාකයක් වන මා රත්මල් සහ ලයිකනයක් වන උස්නියා (**usnea**) බහුලව හමුවන තණබිම් වර්ගය වනුයේ
1) වියළි පතන 2) දමන 3) තෙත් පතන 4) තලාව

02. හානිකර ජීවීන්ගේ ජීවන චක්‍රවල ඇතැම් අවස්ථා පාලනය මගින් ඔවුන්ගේ බෝවීම පාලනය කළ හැකියි. මේ අනුව ගෙමැස්සන්ට බිත්තර දමන ස්ථාන අහිමි කිරීමෙන් ඔවුන් පාලනය කළ හැකියි. ගෙමැස්සා බිත්තර දමන්නේ,
1) පිරිසිදු නිසල ජලයේ 2) කුණුවන කාබනික ද්‍රව්‍ය මත
3) දූෂිත ජලයේ 4) ශාක පත්‍රවල යටි පැත්තේ

03. සර්පයින් විෂ සහිත වුවද පාරිසරික වශයෙන් වැදගත් ය. එමෙන්ම විවිධ ඖෂධ නිෂ්පාදන සඳහා සර්ප විෂ ප්‍රයෝජනයට ගැනේ. ශ්‍රී ලංකාවේ වෙසෙන උග්‍ර විෂ සහිත සර්පයෙකු නොවන්නේ,
1) තිත් පොළඟා 2) පළා පොළඟා 3) වැලි පොළඟා 4) තෙල් කරවලා

04. වර්තමානයේ ලොව පුරා වෙසෙන මිනිසුන් අතර පවතින සම්බන්ධතා නිසා අන්තර්ජාතික විද්‍යාත්මක සංකේත යොදා ගැනීම බහුලව සිදු වේ. අන්තර්ජාතික විද්‍යාත්මක සංකේත අවම ලෙස භාවිත වන ස්ථානය,
1) රෝහල 2) විද්‍යාගාරය 3) මහා මාර්ගය 4) පන්සල

05. වායුගෝලය වායු මිශ්‍රණයකි. වායුගෝලයේ සංයුතිය අනුව වැඩියෙන්ම අඩංගු වායු වර්ගය වනුයේ,
1) ඔක්සිජන් වායුව 2) කාබන්ඩයොක්සයිඩ් වායුව 3) නයිට්‍රජන් වායුව 4) ජල වාෂ්ප

06. ශ්‍රී ලංකාවේ සුවිශාල ඇපටයිට් නිධිය පිහිටා ඇති ප්‍රදේශය කුමක්ද?
1) පුල්මුඩේ 2) කන්කසන්තුරේ 3) එප්පාවල 4) මන්නාරම

07. ම'කරි, ටින්, ලෙඩ් යන මූලද්‍රව්‍යවල සංකේත පිළිවෙළින් දක්වා ඇත්තේ,
1) **Mg , Sn , Pb** 2) **Hg , Zn , Pb** 3) **Hg , Sn , Ld** 4) **Hg , Sn , Pb**

08. පෘථිවියේ බොහෝ දුරින් පිහිටි ස්ථාන අතර කෙටි කාලයකින් තොරතුරු සන්නිවේදනය කළ හැකි වී ඇත්තේ වායුගෝලයේ කුමන ස්ථරයේ දායකත්වය නිසාද?
1) තාප ගෝලය 2) මධ්‍ය ගෝලය 3) ස්ථර ගෝලය 4) බහිර් ගෝලය

09. කාබන්ඩයොක්සයිඩ් අණුව
1) සම පරමාණුක අණුවකි 2) විෂම පරමාණුක අණුවකි
3) කාබන් පරමාණු 2 ක් හා ඔක්සිජන් පරමාණුවකින් සෑදී ඇත. 4) ඒක පරමාණුක අණුවකි.

10. ඝනත්ව වෙනස ප්‍රයෝජනයට නොගන්නා අවස්ථාව වනුයේ
1) ද්විලෝහ පටියේ ක්‍රියාව 2) ද්‍රවමානය භාවිතය
3) කුරුඳු තෙල් නිස්සාරණය 4) යකඩ නිස්සාරණය

11. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) චුම්බකවල සජාතීය ධ්‍රැව ආකර්ශනය වේ.
2) චුම්බකයක බලය වැඩියෙන් පවතින්නේ උත්තර ධ්‍රැවයේ ය.
3) චුම්බක බල රේඛා ත්‍රිමාණ අවකාශයේ පිහිටයි.
4) රත් කරන විට චුම්බකවල ප්‍රබලතාවය වැඩිවේ.

12. පහත දැක්වෙන්නේ **A** හා **B** නම් ලෝහ වර්ග දෙකකින් සෑදූ ද්වි ලෝහක තීරුවක් රත් කළ විට පිහිටි ආකාරය වේ. ඒ අනුව නිවැරදි පිළිතුර වන්නේ,



1) **A** හා **B** ලෝහ වර්ගවල ප්‍රසාරණය සමානය.
2) **B** හි ප්‍රසාරණය **A** වලට වඩා වැඩිය.
3) **A** හි ප්‍රසාරණය **B** වලට වඩා වැඩිය.
4) **A** හා **B** ප්‍රසාරණය පිළිබඳ නිගමනයක් සිදු කළ නොහැක.

13. මෙම සංකේතයෙන් අදහස් වන්නේ,

1) පොද වැසි 2) හිම කැට කුණාටු 3) මීදුම 4) තද වැසි

14. ද්‍රව පීඩනයෙහි දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1) ද්‍රව පීඩනය සෑම දිශාවකටම බලපායි.
2) ද්‍රවයේ ගැඹුර වැඩිවන විට පීඩනය වැඩිය.
3) ද්‍රව තුළ එකම ගැඹුරකදී සෑම ලක්ෂයකම පීඩනය සමානය.
4) ඉහත සියල්ලම

15. පුනර්ජනනය වන ශක්ති ප්‍රභවයක් වන්නේ,
1) මුහුදු රළ 2) ස්වභාවික වායු (**LP** වායුව) 3) ගල් අඟුරු 4) ඛනිජ තෙල්

16. පහත පරිපථ සම්බන්ධව නිවැරදි වගන්තිය තෝරන්න.



(A) (B) (C)

1) **A** හි කෝෂ ශ්‍රේණිගතව සම්බන්ධ කර ඇත.
2) **B** හි කෝෂ සමාන්තරව සම්බන්ධ කර ඇත.
3) **C** හි කෝෂ ද, බල්බ ද ශ්‍රේණිගතව සම්බන්ධ කර ඇත.
4) **B** හි බල්බ ශ්‍රේණිගතව ද, කෝෂ සමාන්තරගතව ද, සම්බන්ධ කර ඇත.

17. පීඩනය අඩු කරගැනීම ප්‍රයෝජනවත් වන අවස්ථාවකි.
1) බැකෝ යන්ත්‍ර වැනි බර වාහනවල ඉතා පළල් ටයර් යොදා ගැනීම.
2) ගුරු පාරක මඩ ගොහොරු තැනකින් ගමන් කිරීමට සිදුවූ විට ඒ මත ලෑලි ඇතිරීම.
3) ගොඩනැගිල්ලක අත්තිවාරම බිත්තිවලට වඩා පළල වැඩිවන ලෙස සෑදීම.
4) ඉහත සියල්ලම

18. පීඩනය මනින ඒකකය
1) $\frac{N}{m}$ 2) ms^{-1} 3) Nm 4) Nm^{-2}

19. පළතුරු අස්වැන්න අඩු වීම හා අස්වැන්නේ ගුණාත්මක බව කෙරෙහි පළතුරු මැස්සාගෙන් සිදුවන හානිය විශාල බලපෑමක් ඇතිකරයි. පළතුරු මැස්සා මර්ධනයට කළ හැකි වන්නේ,
1) පස සමග අළු මිශ්‍ර කිරීමෙන් 2) ඵල ආවරණය කිරීමෙන්
3) කුණු ගොඩවල් නිතර පෙරළීමෙන් 4) ඉහත කිසිවකින් නොවේ.

20. විෂ බීජ නාශකයක් ලෙස භාවිත නොවන රසායනික ද්‍රව්‍ය වන්නේ
1) ක්ලෝරීන් 2) විරංජන කුඩු 3) පොටෑසියම් පර්මැංගනේට් 4) පෙට්‍රල්

11 කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01) A) දෙවන වාර ඇගයීමක් ලෙස වායුගෝලයේ සංරචක, වායුගෝලයේ සංයුතිය හා භූමියෙන් ලබාගන්නා ස්වාභාවික සම්පත් පිළිබඳව සාහිත්‍ය විමසුමක් ඉදිරිපත් කිරීමට 8 ශ්‍රේණියේ සිටින ඔබ කණ්ඩායම් වලට පවරා තිබුණි.

i) සාහිත්‍ය විමසුමට කරුණු එක්රැස් කර ගැනීමට ඔබ උපයෝගී කරගත් මාධ්‍ය 2 ක් නම් කරන්න. (ල. 01)

ii) මෙවන් කාර්යයක් කිරීමෙන් ඔබ තුළ වර්ධනය වන යහපත් ගුණාංග 2 ක් ලියන්න. (ල. 01)

iii) වායුගෝලය බෙදා වෙන්කර දක්වන ප්‍රධාන ස්ථර 5 සඳහන් කරන්න. (ල. 02)

iv) පෘථිවි වායුගෝලයේ ප්‍රධාන සංරචකවල කෘත්‍ය පිළිබඳව ඉදිරිපත් වූ තොරතුරු අනුව නයිට්‍රජන් වායුවේ කෘත්‍යයන් 2 ක් සඳහන් කරන්න. (ල. 01)

v) කාබන්ඩයොක්සයිඩ් වායුවේ ප්‍රතිශතය ඉහළ යාම නිසා ඇතිවන හානිකර ප්‍රතිවිපාකය කුමක්ද? (ල. 01)

B) i) පහත සඳහන් කාර්යයන් සඳහා උපකාර වන්නේ වායුගෝලයේ කවර ස්ථරද?

a) දුර ස්ථාන දෙකක් අතර ගුවන් ගමන් සඳහා

b) හෙලිකොප්ටර ගමන් කිරීම

c) පාරජම්බුල කිරණ පොළව මත පතනය වීම වැළැක්වීම

d) ජෙට් යානා ගමන් කිරීම (ල. 02)

ii) වායුගෝලයේ සංරචක ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගැනීම ජීවීන්ගේ පැවැත්මට අත්‍යාවශ්‍ය වේ. වායුගෝලයේ ප්‍රශස්ථ සංයුතිය වෙනස් වීමට බලපාන ද්‍රව්‍ය වායු දූෂක ලෙස හඳුන්වයි.

a) වායුමය වායු දූෂක දෙකක් හා අංශුමය වායු දූෂක 2 බැගින් සඳහන් කරන්න. (ල. 02)

b) වායුගෝලයේ ප්‍රශස්ථ සංයුතිය වෙනස් වීම නිසා ඇතිවන හානිකර විපාක 2 ක් සඳහන් කරන්න. (ල. 01)

c) වායුගෝලයේ ප්‍රශස්ථ සංයුතිය ආරක්ෂා කිරීමට ගත හැකි පියවර 2 ක් සඳහන් කරන්න. (ල. 02)

C) i) වායුගෝලය මෙන් ම භූමිය ද අපට වැදගත් වේ. පෘථිවිය මත ස්වාභාවිකව හට ගන්නා සමජාතීය ඝන ද්‍රව්‍ය කෙසේ හඳුන්වයිද? (ල. 01)

ii) හුණුගල් දකුණු වෙරළ තීරයේ බහුලව දැකිය හැකි පාෂාණයකි. හුණුගල් ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 2 ක් ලියා දක්වන්න. (ල. 01)

iii) ශ්‍රී ලංකාවේ බහුලව හමුවන ඛණිජ වැලි වර්ග 2 ක් සඳහන් කරන්න. (ල. 01)

iv) උළු හා ගඩොල් පිළිස්සීමේදී රතුපාට වන්නේ ඇයි? (ල. 01)

02) මිනිසාට වාසිදායක මෙන්ම හානිකර සතුන්ගේ ජීවන චක්‍ර හා රූපාන්තරණය පිළිබඳ ඔබ අධ්‍යයනය කර ඇත.

i) a) ජීවන චක්‍රය යනු කුමක්ද? (ල. 01)

b) රූපාන්තරණය ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ල. 01)

ii) සම්පූර්ණ රූපාන්තරණය දක්වන ජීවියෙකුගේ ජීවන චක්‍රය ඇඳ දක්වන්න. (රූප අනවශ්‍යය) (ල. 02)

iii) a) අසම්පූර්ණ රූපාන්තරණය පෙන්වන ජීවීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 01)

b) සම්පූර්ණ රූපාන්තරණය පෙන්වන ජීවීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 01)

iv) රූපාන්තරණය තිබීම එම ජීවීගේ පැවැත්මට වාසිදායක වන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල. 01)

v) පලිබෝධ පාලනයේදී ජීවීන්ගේ ජීවන චක්‍රවල සංවේදී අවස්ථා පිළිබඳ අවබෝධය වැදගත් වේ. පලිබෝධ පාලනයේදී

a) අනුගමනය කරන ප්‍රධාන පාලන ක්‍රම තුන සඳහන් කරන්න. (ල. 1 1/2)

b) එම එක් එක් ක්‍රමයට උදාහරණය බැගින් දක්වන්න. (ල. 1 1/2)

vi) ගෙමැස්සා මගින් බෝවන රෝග දෙකක් සඳහන් කරන්න. (ල. 01)

03) පදාර්ථයේ තැනුම් ඒකකය පරමාණුවයි. පදාර්ථය ඝන, ද්‍රව, වායු ලෙස ප්‍රධාන අවස්ථා තුනකින් පවතියි.

i) පහත දී ඇති මූලද්‍රව්‍ය වල සම්මත සංකේත ලියා ලෝහ අලෝහ බව සඳහන් කරන්න. (ල. 02)

1.	සෝඩියම් -	2.	ගෙන්දගම් -
3.	කාබන් -	4.	රසදිය -

ii) ලෝහ හා අලෝහ මූලද්‍රව්‍ය අතර වෙනස්කම් දෙකක් සංසන්දනය කරන්න. (ල. 02)

iii) පහත අවස්ථා සඳහා භාවිත කරන මූලද්‍රව්‍ය නම් කරන්න.

1. රබර් වල්කනයිස් කිරීම -
2. දහන පෝෂකයක් නිසා පැස්සුම් කටයුතු වලට යොදාගැනීම -
3. මුවහත් ආයුධ තැනීම -
4. ආහාර පිසින බඳුන් සෑදීම - (ල. 02)

iv) ඝන හා ද්‍රව පදාර්ථවල අංශු සැකසී ඇති ආකාරය රූපයකින් දක්වන්න. (ල. 02)

v) ද්‍රවයක අංශුමය ස්වභාවය පරීක්ෂා කිරීමට විද්‍යාගාරයේදී සිදුකළ ක්‍රියාකාරකමක් විස්තර කරන්න. (ල. 02)

vi) ඔබ අධ්‍යයනය කළ ඝන, ද්‍රව හා වායු තත්ත්ව වල පවතින මූලද්‍රව්‍ය බැගින් සඳහන් කරන්න. (ල. 01)

04) A) අතීතයේ සාම්ප්‍රදායික ක්‍රම යොදාගනිමින් හේන් ගොවිතැන සිදුකර ඇත. වර්තමානයේ කෙටි කලකින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට නවීන තාක්ෂණික ක්‍රම භාවිත කෙරේ. මේ යටතේ සුවිශේෂ බෝග වගා ක්‍රම හඳුන්වා දී ඇත.

i) හරිතාගාර වගාව යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ල. 01)

ii) එම වගා ක්‍රමයේදී පාලනය කරන පාරිසරික සාධක 2 ක් ලියන්න. (ල. 01)

iii) විවිධ අහිතකර පාරිසරික තත්ත්ව වලින් හරිතාගාරය තුළ වැඩෙන බෝග වලට ආරක්ෂාව සැලසේ. එවැනි අහිතකර පාරිසරික තත්ත්ව 2 ක් සඳහන් කරන්න. (ල. 01)

B) i) හතු වගාවේදී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු පාරිසරික සාධක දෙකක් ලියන්න. (ල. 01)

ii) වාණිජ වශයෙන් වගා කරනු ලබන හතු වර්ග දෙකක නම් ලියන්න. (ල. 01)

iii) විෂ සහිත හතු හඳුනා ගැනීමට යොදාගත හැකි ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ල. 01)

C) මිනිසා තම අවශ්‍යතාවලට ගැළපෙන පරිදි තම පරිසරය වෙනස් කර ගෙන විවිධ පරිසර ගොඩනගාගෙන ඇත.

i) කාර්මික පරිසරයක ඇතිවිය හැකි ගැටළුකාරී තත්ත්ව දෙකක් සඳහන් කරන්න. (ල. 01)

ii) කර්මාන්තයක් ආරම්භ කිරීමට කිරීමේදී අනුමැතිය ලබාගත යුතු රාජ්‍ය ආයතන දෙකක් නම් කරන්න. (ල. 01)

iii) ජනගහන වර්ධනයත් සමග ජනාවාස පරිසරයක් තුළ පැනනැගිය හැකි ගැටලු 4 ක් ලියන්න. (ල. 02)

05) A) කෙටි පිළිතුරු ලියන්න.

i) සාගර ජලයේ වැඩිපුරම ඇති ලවණය .... ය.

ii) කිරල, කඩොල්, ගිංපොල් වැවෙන්නේ .... පරිසර පද්ධතියේය.

iii) ඩෙංගු රෝගය පැතිරෙන්නේ .... නැමැති මදුරු වර්ගයෙන්ය.

iv) තමාට අවශ්‍ය බෝග හා සතුන් පාලනයට මිනිසා විසින් නිර්මිත පරිසර පද්ධතිය කුමක්ද?

v) පසුගියදා භාවිතය තහනම් කරනු ලැබූ ආහාර රසකාරකය කුමක්ද?

vi) ආහාර පරිරක්ෂක භාවිත කරන්නේ .... සඳහා ය. (ල. 03)

B) දී ඇති ප්‍රකාශ හා ගැළපෙන සංකේතය තෝරන්න.



1 2 3 4

5 6 7

i) තද වැසි ඇතිවේ -

ii) පාරජම්බුල කිරණ නිකුත්වන ස්ථානයකි -

iii) හදිසි ගින්නක දී පිටවන දොරටුව -

iv) පෙට්‍රල් රැගෙනයන බවුසරයක තිබිය හැකි සංකේතයකි - (ල. 02)

C) A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා එහි අක්ෂරය තිත් ඉරිමත ලියන්න.

i)	පක්ෂීන්ගේ හොට විවිධ හැඩයෙන් පැවතීම.	(a)	ගුරුත්ව කේන්ද්‍රය
ii)	ගැඹුරු මුල් පද්ධති ඇති ශාක පසෙන් වැඩිපුර ජලය අවශෝෂණය කිරීම	(b)	පරපෝෂිතාව
iii)	මුහුදු ලම්ප්‍රේන් කරදිය මසුන්ගේ ලේ උරා බීම	(c)	විලෝපිතාව
iv)	හාවා උළුපියළිය ආහාරයට ගැනීම	(d)	ආලෝකය
v)	රබානක් එහි හරි මැදින් සමබර කිරීම	(e)	ජීව විවිධත්වය
vi)	පුෂ්පවල වර්ණ ඇතිවීමට අවශ්‍ය අජෛව සාධකය	(f)	තරඟය

(ල. 06)

06) A) ඝන, ද්‍රව මෙන්ම වායු නිසාද පීඩනයන් හට ගනී. U නළයක් ගෙන, එයට ජලය සවල්පයක් දමා, තැබූ U නළයක් සහ තවත් U නළයකට ජලය දමා එක් කෙළවරක් බැලූනයක් ගැටගසා තැබූ U නළයක්ද පහත දැක්වේ.

වාතය සහිත බැලූනය සවිකිරීමට පෙර X හා Y බාහු දෙකෙහි ජල මට්ටම් සමානව පවතී. එහෙත් බැලූනය සවි කිරීමෙන් පසු U බාහුවේ ජල මට්ටම පහත බසියි.



i) මෙහි A අවස්ථාවේ U නලයේ බාහු දෙකේ ද්‍රව මට්ටම් සමානව තිබීමට හේතුව කුමක් ද? (ල. 01)

ii) B අවස්ථාවේ U නලයේ බාහු දෙකේ ද්‍රව මට්ටම් අසමාන වීමට හේතුව කුමක්ද? *(ල. 01)*

iii) B අවස්ථාවේ බැලූනය නොගලවා U නලයේ බාහු දෙකේ ද්‍රව මට්ටම් අතර වෙනස තවත් වැඩිකළ හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න. *(ල. 01)*

iv) එදිනෙදා ජීවිතයේ දී වායු පීඩනය භාවිත වන අවස්ථා 2 ක් ලියන්න. *(ල. 01)*

B) පීඩනය සම්බන්ධව 8 ශ්‍රේණියේ සිසුන් පිරිසක් විසින් සකස් කරන ලද ඇටවුමක් පහත දැක්වේ.



i) ගඩොල පොලිතින් මල්ල උඩින් තැබූ විට දක්නට ලැබුන නිරීක්ෂණය කුමක් ද? *(ල. 01)*

ii) එම නිරීක්ෂණයට හේතුව පැහැදිලි කරන්න. *(ල. 01)*

iii) ඉහත උපකරණ පමණක් භාවිතයෙන් පීඩනය කෙරෙහි වර්ගඵලය බලපාන අයුරු පෙන්විය හැකි ක්‍රියාකාරකමක් කෙටියෙන් දක්වන්න. *(ල. 01)*

iv) මුහුදු මට්ටමේ දී වායුගෝල පීඩනය පැස්කල් වලින් කොපමණද? *(ල. 01)*

v) එදිනෙදා ජීවිතයේදී,

a) පීඩනය වැඩි කරගත යුතු අවස්ථා

b) පීඩනය අඩු කරගත යුතු අවස්ථා 2 ක් බැගින් ලියන්න. *(ල. 02)*

vi) සේලයින් බටයට පාට කළ ජලය යොදාගන්නේ ඇයි? *(ල. 01)*

07) **A)** විදුලි ස්ත්‍රික්කයක අද අපට නැතිවම බැරි උපකරණයකි. එහි උෂ්ණත්වය නියත මට්ටමක තබා ගැනීම වැදගත් වේ. නියත උෂ්ණත්වයකට පත්වූ විට විදුලිය සැපයීම නතර කළ යුතුය.

i) රත් වූ පසු පරිපථය විවෘත වී විදුලිය ගලා යාම නැවතීමට ස්ත්‍රික්කයේ පරිපථයට සම්බන්ධ කර ඇත්තේ කුමක් ද? *(ල. 01)*

ii) විද්‍යුත් චුම්බකයක් සාදා ගන්නා ආකාරය රූපසටහනක් සහිතව විස්තර කරන්න. *(ල. 03)*

B) පහත දැක්වෙන්නේ ශිෂ්‍යයෙක් විසින් නිර්මාණය කරන ලද ගිනි සංඥා උපකරණයක සාමාන්‍ය අවස්ථාවකි. ගින්නක් ඇති වූ පසුව ගිනි සංඥා උපකරණයේ පරිපථය තිබෙන ආකාරයට ඉහත පරිපථය සකස් කර නැවත අඳින්න. *(ල. 02)*



C) ප්ලාස්ටික් කඳක් සහිත විදුලි පන්දමක ඇතුළත ස්වරූපය රූපයේ දැක්වේ.



i) මේ විදුලි පන්දමෙහි පරිපථ රූප සටහනක් සංකේත භාවිත කර අඳින්න. *(ල. 02)*

ii) මෙහි වියළි කෝෂ සම්බන්ධ කර ඇති ආකාරය හඳුන්වන්න. *(ල. 01)*

iii) කිසියම් විදුලි පන්දමක කෝෂ සමාන්තරගතව සම්බන්ධ කර තිබුණි නම් ඉන් ලැබෙන
අ) වාසියක් ලියන්න. ආ) අවාසියක් ලියන්න. *(ල. 02)*